**මඩකලපුව මහනගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 22 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 30 දින නාගරික කොමසාරිස් වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු පළාත් පාලන සේවයේ සේවකයන් සඳහා වන විශ්‍රාම වැටුප් දායක මුදල් රු.28,799,619 ක් ගිණුම්ගත කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.105,689,284 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.110,729,563 ක් විය. .

## 2.2 ආදායම් කළමනාකරණය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම්

මහ නගර සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම් ආදිය පිළිබඳ විස්තර මෙහි පහත දැක්වේ.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් | 20,723,359 | 20,795,676 | 21,765,402 |
| දැන්වීම් ගාස්තු | 3,284,642 | 4,386,397 | 1,178,878 |
| වෙළෙඳ බලපත්‍ර | 9,256,600 | 10,112,864 | 2,036,788 |
| ගවඝාතකාගාර ගාස්තු | 31,939 | 36,980 | 12,133 |
| කඩ බදු දීම | 15,603,004 | 19,288,037 | 6,710,186 |
| විනෝද බද්ද | 1,367,641 | 1,395,155 | 917,927 |
| නේවාසිකාගාර කුලී | 98,554 | 98,554 | 326,350 |
| බාහිර කඩ කුලි | 2,708,230 | 2,412,908 | 1,311,296 |
| වෙළඳපොල කඩකුලී | 3,139,500 | 3,162,263 | 949,033 |
| තානායම් කුලී ගාස්තු | 468,000 | 390,000 | 893,823 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

මියගිය සේවකයින් තිදෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු.10,057 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ අඩුපාඩු සහ ඌනතානවයන් සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | ඇතුළත් විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.2 (අ) | නැති වූ වතුර බවුසරයේ පිරිවැය පොත්වලින් ඉවත් නොකිරීම. |
| 2015 | 3.2.2 | 2008 වර්ෂයේ සිට හිඟහිටව පැවැති වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 3.2.3 | රජයේ ආයතන 03 කට ලබාදුන් තානායම් සම්බන්ධයෙන් කුලී අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.1 (ආ) | විශ්‍රාම ගිය සේවකයින් 05 දෙනෙකුගෙන් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| 2015 | 4.1 (ඇ) | සේවය අත්හිටවූ සේවකයින් 06 දෙනෙකුගේ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.2 (ආ) | පුද්ගලික ඉඩම් කොටස්වලට බෙදා විකිණීමේදී පොදු පහසුකම් සඳහා පවරා දුන් ඉඩම් කොටස් 05 ක් හිටපු කොමසාරිස් විසින් වංචනිකව අයිතිය මාරු කිරීම සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| 2015 | 4.4 (අ) | මහජනතාව වාසය කරන ස්ථානයට යාබදව ඉදිකර තිබූ ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයෙන් පරිසර දූෂණය වීම සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |

## 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |